UNIVERSITY OF PERADENIYA
**දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය**
**CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION**
**தொடர் தொலைக்கல்வி நிலையம் - பேராதனைப் பல்கலைக்கழகம்**
**ශාස්ත්‍රවේදී උපාධි (බාහිර - නව නිර්දේශය) පරීක්ෂණය - 2024**
**பொதுக்கலைத் தேர்வு (வெளிவாரி – புதிய பாடத்திட்டம்) – 2024**
**General Degree Examination in Arts (External - New Syllabus) – 2024**

**(19 වන සියවස දක්වා සිංහල සාහිත්‍යය හා නාට්‍ය)**

**SINE 102**

කාලය පැය**(03)** තුනයි.
மூன்று(03) மணித்தியாலங்கள்
Time three **(03)** Hours.

නොපැහැදිලි අත්අකුරුවලට ලකුණු කපනු ලැබේ.
எழுத்து தெளிவில்லாதவிடத்து புள்ளிகள் குறைக்கப்படும்.
Marks will be deducted for illegible hand writing.

ප්‍රශ්න 05කට පිළිතුරු සපයන්න.
------ வினாக்களுக்கு மட்டும் விடையளிக்க.
Answer _____ questions only.

මෙම ප්‍රශ්න පත්‍රයේ අඩංගු ප්‍රශ්න සංඛ්‍යාව (09) කි.
இந்த வினாப்பத்திரத்தில் ------ வினாக்கள் உள்ளன.
There are ------- questions in the question paper.

පළමු වන කොටසෙහි පළමු ප්‍රශ්නයෙහි උද්ධෘත පහක (05)කට ද, දෙවන හා තුන්වන කොටස්වලින් එකකින් අවම වශයෙන් **එක්** ප්‍රශ්නයක්වත් තෝරාගෙන **ප්‍රශ්න පහක (05)කට** පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

**1. පහත දක්වා ඇති උද්ධෘත අතුරින් අ, ආ, ඉ යන කොටස්වලින් දෙකක් ද (02), ඊ, උ, ඌ, එ යන කොටස්වලින් තුනක් (03) ද ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. (පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගන්න).**

(අ). "හෙ හැම අරණ්‍යයෙහි හසර නැති කෙළෙ. දර පලා සඳහා වල් යන්නාහු නැති. රෑ ගමට වැදෑ පයින් පැහැරෑ දොර ගළවා පියා එහි හොතුවන් මරා-පියා 'එකෙකැ දෙකෙකැ'යි ගැණැ- ගෙනැ යෙයි. එ කල්හි ගම්වැස්සො ගම් පියා ගොස් නියම්ගම් වන්හ නියම්ගම්වැස්සො ගොස් නුවර වන්හු. තුන් යොජනක් තන්හි මිනිස්හු ගෙ පියා දරුවන් අතැ ගෙනැ ගොස් සැවත් නුවර වටා කඳවුරු බැඳැ **රාජාංගණ** යෙහි රැස් වැ "මහරජ, තා ගෙ රට අංගුලිමාල නම් සොරෙක් වි යැ" කිය කියා වලපිත්."

(**අමාවතුර**, කෝදාගොඩ ඤාණාලෝක සංස්. 132පි).

(i) ගම් වැසියෝ කිනම් තැනකට ගියෝ ද?
(ii) මිනිසුන් වැලපීමට හේතුව කුමක් ද?
(iii) "දර පලා සඳහා වල් යන්නාහු නැති" යන උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.
(iv) '**රාජාංගණ**' යන පදයෙහි අර්ථ විවරණය කරන්න.

(ආ) "බුදුන්ගේ පියවර එබූ තැන්හි පෙනෙව යි යන අධිෂ්ඨානයක් ඇති ව විනා නොපෙනෙන්නේය. මෙතෙක් දෙනාට පෙනෙව යි අධිෂ්ඨාන කළ කල ඔවුන්ට මුත් සෙස්සවුන්ට නොපෙනෙයි. මෙතෙක් කල් තිබේව යි අධිෂ්ඨාන කළ කල සතරමහ දිවයින වැසි වැස එක හෙළා වතුරු හෙළා නමුදු කෙතෙක් ඇත් අස් ගව මහීෂාදීහු මැඩගෙන යෙත් නමුදු කෙසගක් පමණ තෙනටත් උවදුරෙක් නොවෙයි. ඒ පියවර මකන පිණිස ඉදින් ඍද්ධිවන්ත කෙනෙක් **වෙරම්භවාතය** වැනි මහ සුළඟක් මවා පැවාහු වී නමුදු පියවර එබූ තෙනින් ලේඩිත්තක සා රජස් සුඟකුත් සොල්වාපිය නොහෙති. කිසි කෙනෙකුදු පියවර මකාලිය නොහෙති."

(**සද්ධර්මරත්නාවලී**, ප්‍රාචීන භාෂෝපකාර සහ සමාගම, සංස්. 160පි).

(i) බුදුරජාණන් වහන්සේගේ පියවර සටහන යමෙකුට දැක ගත හැක්කේ කෙසේ ද?

(ii) සෘද්ධිවන්තයෙකුට බුදුරදුන්ගේ පියවර සටහන මැකිය හැකි ද?

(iii) "පියවර එබූ තෙනින් ලේඛිත්තක සා රජස් සුගකුත් සොල්වාපිය නොහෙති." යන උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.

(iv) '**චෛරමහවෘතය**' යන පදයෙහි අර්ථ විවරණය කරන්න.

(ඉ) "මෙසේ ඔවුන් විසින් කියන ලද රූප වර්ණනා අසා ශ්‍රවණ සංසර්ගයෙන් ම ඒ කුමාරිකාවන් කෙරෙහි පිළිබඳ සිත් ඇත්තාවූ රජ්ජුරුවෝ එම විට තමන් ගේ මහත් වූ **චතුරංගිනී** සෙනාව පිරිවරා ගොස් මහා බෝ මැඬ පවුර වටා පිටතින් සෙනාව රැකවල සිටුවා තෙල කුමාරිකාව පලා යා නොදී අල්වයි නියොග කළහ. එ කල්හි සෙනාව ද මේ කුමාරිකාව අපි අපිම අල්වම්හයි සාහසිකව තරයේ සැරසී සිට ගත්හ."

(**සද්ධර්මාලංකාරය**, කිරිඇල්ලේ ඥාණවිමල, සංස්. 398 පි).

(i) රජතුමා කුමාරිකාව අල්වා ගැනීමට සිතුවේ කුමක් නිසා ද?

(ii) සේනාව සිටුවාලූයේ කොතැන ද?

(iii) "ඔවුන් විසින් කියන ලද රූප වර්ණනා අසා ශ්‍රවණ සංසර්ගයෙන් ම..." යන උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.

(iv) '**චතුරංගිනී**' යන පදයෙහි අර්ථ විවරණය කරන්න.

(ඊ) සිහිහිමියන් ගී
ද(කු)ත් න(ැ)මි වී සිත අතින්
මල් ගත් මීල(ැ)සි
වියි ද රිසි (ෙ)ක (ෙ)ස(යින්)
(තා) බල(ය්) අස ද නැගී මෙය

ස්වස්ති
බුද්ගමුවෙහෙර **නියමජෙට් නා සගයිම්** ලීමි
බලන්නට ගැහිනින් බැලූමො සිහිගිරි
(පි)රි මනපොළ් කතුන් ම ය(ත්)
ත ළ පොලන්නට් හුන්

(**සිගිරි ගී**, නන්දසේන මුදියන්සේ, සංස්. 48-49 පද්‍ය).

(i) පළමු කවියට අනුව සිත නැමුණේ කුමකින් ද?

(ii) **නා සගයි** සීගිරි ගියේ කුමක් සඳහා ද?

(iii) "වියි ද රිසි (ෙ)ක(ෙ)ස(යින්) (තා) බල(ය්) අස ද නැගී මෙය." යන උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.

(iv) '**නියම්ජෙව්**' යන පදයෙහි අර්ථ විවරණය කරන්න.

(ඇ) කෙසෙ ද දනිති දැන් සරතැස ඔහු තමාගේ
වළඟට පින් පියවුරෙන් දුවනින් දඟට දුක්දා

තමා යහ **දසනෙත්** නුවන් පිය තෙපලෙන් කන්
පහසින් ගත් ගෙනැ කෙසේ මන නොදිහි මා සිත් ගත්

(**කව්සිළුමිණ**, ඇම්. බී. ආරියපාල, සංස්. 553-554 පද්‍ය).

(i) පළමු පද්‍යයට අනුව පබාවතිය නොදන්නේ කුමක් ද ?

(ii) දෙවන පද්‍යයට අනුව පබාවතිය නො දී, ගෙන ගියේ කුමක් ද?

(iii) "වළඟට පින් පියවුරෙන් - දුවනින් දඟට දුක්දා" යන උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.

(iv) '**දසනෙත්**' යන පදයෙහි අර්ථ වවරණය කරන්න.

(ඈ) නුඹ සිය නි ති ර් ලැගුමට එතන එති
ඉන් **කුලප** **ති** සෙබඩක වෙත ලෙසේ රුැති
සැක නොපැව ති ගන සාතුරු වදුරු ඇති
තුගු වනප ති තුර'ගෙක ලගුතු යා පති

පියයුරු අඳුරු තුරු සළුපටිනි වසමි නි
තිසකත එසඳ එත සියකර අකුළමි නි
පරදර වරද වරමින් වර ගුණ සිති නි
සියකුල සිරිත රිවි මුළු ලොවට පෑ වෙ නි

(**මයූර සන්දේශය**, ඩබ්. එෆ්. ගුණවර්ධන, සංස්. 95-96 පද්‍ය).

(i) මයූරයාට නවාතැන් ගන්නා ලෙස නියම කරන්නේ කවර තැනක ද?

(ii) සූර්යයා හකුළා ගත්තේ කුමක් ද?

(iii) "පරදර වරද වරමින් වර ගුණ සිති නි
සියකුල සිරිත රිවි මුළු ලොවට පෑ වෙ නි" යන උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.

(iv) '**කුලපති**' යන පදයෙහි අර්ථ විවරණය කරන්න.

(එ) කුමර කෙළි පුරු දු ව
ගුරුන් පෙම්කොඳ තරි ඳු ව
දිසි පින්පිඩු බ ඳු ව
සොඳුරු ගුත්තිල නමින් පසි ඳු ව

සුරඟන උව වෙත ට
අදනා සොඳුරු රුසිර ට
**නරඟ රඟ** පසුකො ට
පැමිණ සපිරුණු සොළොස් වයස ට

(**ගුත්තිල කාව්‍යය**, ඩබ්. එෆ්. ගුණවර්ධන, සංස්. 109-110 පද්‍ය).

(i) "ගුත්තිල" දෘශ්‍යමාන වූයේ කුමක් ලෙස ද?
(ii) ගුත්තිල කවුරුන් ආකර්ෂණය කළේ ද?
(iii) "කුමර කෙළි පුරු දු ව
ගුරුන් පෙම්කොඳ තරි ඳු ව" යන උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.
(iv) '**නරඟ රඟ**' යන පදයෙහි අර්ථ විවරණය කරන්න.

## II කොටස

2. "විශ්මයාවහ ලෙස කතාවක් ඉදිරිපත් කිරීම, **අමාවතුර** කතුවරයා සතු අපූරු කුසලතාවකි." මෙම අදහස නියමිත කතා ඇසුරෙන් විමසන්න.

3. "සරල බස්වහරත්, නැවුම් උපමා භාවිතයත් හේතු කොට ගෙන **සද්ධර්මරත්නාවලිය**, සාමාන්‍ය ශ්‍රාවකයා අතර බෙහෙවින් ජනප්‍රිය වී ය." මෙම ප්‍රකාශනයෙහි සත්‍යාසත්‍යතාව නිර්දේශිත කතා ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

4. **සද්ධර්මාලංකාරයෙහි** කේන්ද්‍රීය අරමුණ දක්වා, කෘතියෙහි අන්තර්ගත කතා මඟින් එකී අරමුණ සාධනය වන්නේ දැ'යි නියමිත කතා ද උපයෝගී කරගනිමින් පෙන්වා දෙන්න.

5. "සිංහල ගැමි **ශාන්ති කර්මවල** පදනම බුදුසමය සහ පැරණි සමාජයෙහි පැවති දේව විශ්වාසය දැ'යි" සනිදර්ශනාත්මක ව විවරණය කරන්න.

## III කොටස

6. "**සිගිරි කවියෙහි** අපූර්වත්වය මතුවන්නේ ප්‍රස්තුත විෂයයෙහි නො ව ප්‍රකාශන විලාසයෙහි ය." මෙම අදහස නිදසුන් සහිත ව විමසන්න.

7. පිරිමි සිතක විරහව සජීව ලෙස චිත්‍රණය කිරීමට **කව්සිළුමිණෙ** කවියා දක්වන සාමර්ථ්‍යය අදාළ වැනුම් මඟින් පැහැදිලි කරන්න.

8. ප්‍රස්තුතයට උචිත රිද්මයත්, ශබ්දාර්ථ සංකලනයත් නිසා ම, **මයූර සන්දේශය** රමණීය පද්‍ය කාව්‍යයක් බවට පත්ව ඇති ආකාරය නිදසුන් සහිත ව පෙන්වා දෙන්න.

9. "සිංහල පද්‍ය සාහිත්‍යයෙහි ලා ස්වභාවෝක්තිය අතිරමණීය ලෙස යොදාගත් විශිෂ්ටතම කවියා වැත්තෑවේ හිමි ය." මෙම අදහස පිළිබඳ ඔබේ මතය **ගුත්තිල කාව්‍යය** ඇසුරෙන් සනිදර්ශනාත්මක ව පැහැදිලි කරන්න.

(පළමු වන පිළිතුරට ලකුණු 40කි (5x8).
අනෙක් සෑම පිළිතුරකට ම ලකුණු 15 බැගිනි)